## රුහුණ විශ්වවිද්‍යාලය

## 2016/2017 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි 3000 ස්ථලය
## පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්

## SLS 31653 - සංස්කරණ ක්‍රමවේදය

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
(නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.)

කාලය පැය 03

01. පුරාණ කෘතියක් සංස්කරණය කිරීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

02. "ප්‍රබන්ධ සාහිත්‍ය කෘතියකට වඩා ශාස්ත්‍රීය ග්‍රන්ථයකට විෂය සූචිය අවශ්‍ය අංගයකි." සාකච්ඡා කරන්න.

03. ග්‍රන්ථ සංස්කරණය යනු කුමක් දැයි හඳුන්වා, පුස්කොළ පොත් සංස්කරණයේ දී ආධුනික සංස්කාරකවරයෙකුට මුහුණ දීමට සිදුවන ගැටලු සාකච්ඡා කරන්න.

04. පහත දැක්වෙන ඡේදය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

පින්වත් මඟිය තෝ කොහි සිට එන්නෙහි ද තාපසතුමනි මම අනුරාධපුර නගරයේ සිට පැමිණියෙමි අහා අහන්නත් සන්තෝෂ යි ලංකාවේ අග්‍රරාජධානියේ අනුරාධපුර රාජ්‍යයේ වත්මන් තොරතුරු මොනවා ද අනේ ස්වාමීනි වට පිට බලමින් නගරයේ ජනයා සිටිනුයේ මහා කලකිරීමකිනි පීඩනයකිනි සංවේගයකිනි මඟිය එසේ වීමට හේතු කිම ස්වාමීනි බෝධිසත්වගුණෝපේත සකලජන හෘදයානන්දකර සිරිසඟබෝ මහරජාණන් වහන්සේ රාජ්‍යය හැරදා සියලු සම්පත් ප්‍රතික්ෂේප කොට වනගත වූ දා පටන් ඔහුගේ මලණුවන් වූ ගෝඨාභය නිරිඳුන්ගේ වැයම ඔහු මරවා හිස ගෙන්වා ගැනීමට යි ඒ සඳහා ඔහු රන් කහවණු දහසක් ද ගෙවයි චෞරජනයෝ අහිංසක මිනිසුන්ගේ හිස් කපා රැගෙන ගොස් සිරිසඟබෝගේ හිස යැයි කියති රජතුමා ඒවා ප්‍රතික්ෂේප කරයි ඉතින් ස්වාමීනි ජනයා නො කලකිරී සිටිත් ද මඟිය දැන් ඒ සිරිසඟබෝ කොහි වෙසෙයි ද නිසැක ව නො දනිමි ස්වාමීනි එහෙත් අනුරාධපුරය ආසන්නයේ මහ වනයක වෙසෙති යි ආරංචි පැතිර ඇත

ස්වාමීනි දැන් ඉර මුදුන් ව ගියේ ය මා සමීපයෙහි බත්මුලක් ඇත මම එය ඔබ වහන්සේගේ දිවා ආහාරය පිණිස පූජා කරමි එය වළඳා කුසගිනි නිවා මඳක් සැතපෙනු මැනවි මඟිය ඔබට බොහෝ පින් සිදු වේවා ඔබ කළ උදවුවට මම ප්‍රත්‍යුපකාරයක් කරමි සිරිසඟබෝ රජතුමා නම් මම වෙමි මාගේ හිස මම නුඹට පරිත්‍යාග කරමි නුඹ එය ගෙන ගොස් රජුට පෙන්වා එකී තෑගි මුදල ලැබ ධනධාන්‍යයෙන් ආඪ්‍ය ව සතුටින් ජීවත් වෙව එසේ ම මා නිසා අසරණ මිනිසුන්ගේ හිස් කපා මේ කරන මහා විනාශය වළකා ලව අනේ මහරජතුමනි මට ඔබ වහන්සේගේ හිස එපා මා දුඃඛිත වුවත් අනූනට අත නො පා එදා වේල සරි කර ගෙන ජීවත් වෙමි ඔබ වහන්සේ චිරාත් කාලයක් යෙහෙන් වැජඹෙන සේක්වා නැවත ද ලංකා රාජ්‍යය භාර ගෙන අසරණ ජනයා සසරණ කරන සේක්වා බෝධිසත්යෝ නම් කරුණාවන්තයහ ත්‍යාගවන්තයහ පරදුඃඛදුඃඛිතයහ



69

05. (අ) සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.

i. සිසුහු උදෙසා වෙන් කරන ලද විවේකාගාරයක් ඇත.

ii. කුණුකන්ද කඩා වැටෙති'යි පරිසරවේදීහු අනතුරු ඇඟවූහ.

iii. පුටුව ද මම ද පෙරළී බිම ඇද වැටුණෙමි.

iv. බල්ලන් බුරත් නම් සොරු පලා යත්.

(ආ) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවන්න.

i. ගුවන් නියමුවෝ ඉහළ අහසෙහි ගුවන් යානා පදවති.

ii. දිසාපාමොක් ඇදුරුතුමාණෝ තා පැසසූහ.

iii. හිඟන්නා රිලවකු නැටවූයේ ය.

iv. උගත්තු කුමාරතුංගයන් ඇගැයීමට ලක් කරති.

(ඉ) නිවැරදි වරණය තෝරන්න.

i. ක්‍රීඩකයා හෝ ක්‍රීඩිකාව ජාත්‍යන්තර තරගයට ඉදිරිපත් (වන්නී ය / වන්නේ ය.)

ii. බුරුමය (හෙවත්/නොහොත්) මියන්මාරය ආසියාතික රටකි.

iii. (ගුරුවරු/ගුරුවරුන්) මැනවින් අධ්‍යාපන කාර්යයේ නිරත වෙත්වා.

v. ප්‍රබලයෝ මෙලොව සිටින (දුබලයෝ/දුබලයන්) නො පෙළත්වා!

06. මෙහි (අ) කොටස ආදර්ශයට ගනිමින් සම්මත සංකේත භාවිතයෙන් (ආ) කොටසේ සෝදුපත සකසන්න.

**(අ කොටස)**

මෙම භාෂා තුනෙහිම '1' යන අර්ථ විෂයෙහිලා, පුරුෂ/ස්ත්‍රී වශයෙන් ලිංග භේදයක් පොදුවේ බලපා තිබීමෙන් හා, එම අර්ථය සමාන-නිරූපණ වලින් ඉදිරිපත් වීමෙන්, එම භාෂා අතර ඇති සාම්‍යතාව ආකස්මික නොවන බව තහවුරු වෙයි.

භාෂා කිහිපයක් අතර, භාෂා රූප වශයෙන් දැක්වෙන මේ ආකාර අනුරූපතාවලින් අනාවරණය වන්නේ, එම භාෂා සියල්ලම එකම භාෂා සම්ප්‍රදායක් කරා දිවෙන බවයි. මෙම භාෂා සම්ප්‍රදාය දෙආකාර විය හැක.

(a) ප්‍රස්තුත භාෂා සියල්ලම එකම පොදු සම්ප්‍රදායකින් ඇති වූ ඒවා වීම:

(b) ප්‍රස්තුත භාෂාවලින් එකකින්, අනෙක් භාෂා යථෝක්ත භාෂා-රූප ණයට ගැනීම යනුවෙනි. මෙහි දී (b) උපකල්පනය ප්‍රතික්ෂිප්ත වෙයි. හේතුව.

(ආ කොටස)

මෙම භාෂා තුනෙහිම '1' යන අර්ථ විෂයෙහිලා ස්ත්‍රී/පුරුෂ වශයෙන් විෂයෙහිලා ලිංග භේධයක් පොදුවේ බලපපා තිබීමෙන් හා එම අර්ථය සමානනිරූපණවලින් ඉදිරිපත් වී මෙන් එම භාෂා අතර නොමැති අසාමාන්‍යතාවයට ආකසමික නො වන බව තහවුරු වෙයි. භාෂා කීපයක් අතර භාෂා

රූප වශයෙන් දැක්වෙන මේ ආකාර අනුරූපතාවයලින් අනා වරණය වන්නේ, එම භාෂා සියල්ලම එකම භාෂා සම්ප්‍රදායක් කරා දිවෙන බවයි.

මෙම භාෂා සම්ප්‍රදාය දෙ ආකාර විය හැක. (a ප්‍රස්තුත භාෂා සියල්ලම එකම පොදු සම්ප්‍රදායකින් ඇති වූ ඒවා වීම:

b) ප්‍රස්තුත භාෂාවලින් එකකින් අනෙක් භාෂාරූප ගණයට නොගැනීම යනුවෙනි. මෙහිදී (b) උප කල්පනයම ප්‍රතික්ෂිප්ත වෙයි.

07. පහත දැක්වෙන පදවල අක්ෂර වින්‍යාස දෝෂ නිවැරදි කරන්න.

| | | |
|---|---|---|
| ශබ්ධාර්ථ | උච්ඡාරණය | සමස්ථ |
| උපාධි ප්‍රධානෝත්සවය | මර්ධනය | විශිෂ්ය |
| ප්‍රථිපල | ලේඛණය | කොට්ඨාශ |
| ස්පුට | පුරිසධම්මසාරථී | පරිසණක |
| න්‍යෂ්ඨික | දෘෂ්ඨී | වීරෝධාර |
| කණිෂ්ඨ | පුස්ථකාලය | ප්‍රදර්ශණය |
| සීඝ්‍ර | ඥාණය | වර්දනය |
| විශ්මය | ඖචිත්‍යය | මතුල |

08. පහත සඳහන් මාතෘකා අතුරෙන් <u>දෙකකට</u> (02) කෙටි සටහන් ලියන්න.

i. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලී සැකසීම

ii. සෝදුපත් කියවීමේ ඇති වැදගත්කම

iii. ආවසානික සටහන් (End Notes)

iv. අකාරාදිකරණය

(සෑම පිළිතුරකට ම ලකුණු 12 බැගිනි.)

@@@@@@@@@@@@@